# ආයුර්වේද රෝහල



ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි
එකම බලයලත් ආයුර්වේද රෝහල

ඔබගේ සියලුම රෝග නිට්ටාවට සුවකර ගැනීමට ප්‍රත්‍යක්ෂ ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර හා පංචකර්ම ප්‍රතිකාර

- ආමවාත ඇතුළු සියළුම සන්දිපත් රෝග
- පීනස් රෝග, සිසේ, ඇසේ රෝග
- සියළුම කෙදුනාරටියේ හා තුනටියේ වේදනා
- සුදුකබර, පොතුකබර ඇතුළු සියළුම සමේ රෝග
- මානසික රෝග හා ඉරු රුදාව
- අර්ශස් රෝග හා මීමැරස්මෝරය
- ලිංගික අප්‍රානිකත්වය
- මුත්‍රාගල් හා වකුගඩු ඇතුළු මුත්‍රාශගත රෝග
- අකලට කෙස් පැසීම හා තට්ටය පෑදීම
- අම්ලපිත්තය, රත්පිත් ගත රෝග
- සියලුම පංචකර්ම චිකිත්සා

වසර 20ක ආයුර්වේද පලපුරුදු
ආයුර්වේද විශේෂඥ
වෛද්‍ය සන්තෝෂ් යාදේව් B.AMS, PGDAYDS, AAA
0410 914 987, (03)9774 7650

පංචකර්ම හා කැඩුම් බිඳුම් විශේෂඥ
දේශබන්දු වෛද්‍ය බන්දු දිසානායක DA (SRI LANKA)
0419 874 469

Medibank, AHM, HBF, Australian Unity, Grand Unity රක්ෂණ ආවරණ හිමියි

NO:41, BUCKLEY ST-NOBLE PARK, VI3174
NO:77, CANTERBURY ROAD, BLACKBURN, VIC3130
NO:125, STUD ROAD, DANDENONG, VI3175
www.ayurvedayoga.com.au


18 වන පිටෙන්

තොරව යහපත් අරමුණක් සහිතව වැඳුම් පිදුම් කිරීම මානව උරුමයක් නොවන්නේද ? යන ප්‍රශ්ණය මගේ ප්‍රති උත්තරය විය. යහපත් අරමුණක් ඉටුකර ගත හැක්කේ වැඳීමෙන්ද ? එය ඉටුකර ගැනීමට ක්‍රියා කිරීමෙන්ද ඔහු පෙරළා ප්‍රශ්න කළේය. සෑම විටම ක්‍රියාව වැදගත් වුවත් සෑම ක්‍රියාවක් සමඟම සිත මුල්වන නිසා මානවයාගේ හැසිරීම් භෞතික වාදයෙන් පමණක් තක්සේරු කළ නොහැකි බවට මතවාද රාශියක් මතුවුනි. පංචේන්ද්‍රයන් පිනවන අධ්‍යාත්මය ජීවත්වීමේ භෞතික අවශ්‍යතාවන්ගෙන් පමණක් තෘප්තිමත් කළ හැකි ද ?

ආදී මානවයාගේ පටන් නොදියුණු මිනිසා යොදාගත් ඇදහිලි විශ්වාස මත පදනම් වූ පිදිවිලි හා ගතුකර්ම වර්තමානයට යොදා ගැනීම ප්‍රාථමික චින්තනයක් බවට ඔහු තුළ වුයේ දැඩි මතවාදයකි. තරුණ සමාජයම දෙපිලකට බෙදී මේ පිළිබඳව සංවාදශීලි විය. නුතන විද්‍යාඥයින් අනාගතයේ අනෙකුත් ග්‍රහලෝක සමඟ සෘජු සම්බන්ධතා පැවත්වීමෙන් අනාගත මිනිස් සන්හතියේ සිදුවන වෙනස්කම් පිළිබඳ දත්ත ආශ්‍රිතව තිළිණ පුතා ඉදිපත් කළ විග්‍රහය සමරේගේ නොමද ඇගයුමට ලක්විය. ඒ අනුව අනාගතයේ භෞතික මිනිසා සක්වල ජය ගන්නා ආකාරයද පැහැදිලි කලේය. කුස පිරවීමට වඩා නුතන මිනිසා සිත පිරවීමට ගන්නා උත්සාහයේ දී කලාව - පදනම් කරගත් ගායන - වාදන - නර්තන-වලට යොමු වී ඇති ආකාරය පිළිබඳ තරුණ දූ පුතුන්ගේ සෞන්දර්ය සාකච්ඡාව සැවොම ප්‍රබෝධයට පත් කළේය. මේ වනවිට මධුවිත ද රසාලිප්නයකට වර්ධනය වීම ඊට හේතු විය.

අරමුණක් ඇතිව වැඳුම් - පිඳුම් කිරීමේ වටිනාකමක් ගැන කලින් කථාකලා නේද ? ඒ කියන්නේ කොහොමද ? නැවතත් සමරේ ඒ මාතෘකාවට හැරුණි. "කාලය - දේශය - වර්තමානයෙන් තොරව මනු සතත්-වයාට සතුන්ට වඩා බියක් - හුදකලාවක් දැනෙනවා. ඒ නිසාම ඉර හඳ තාරකා වලට අව්ව වැස්සට ගහ කොළට විතරක් නොවේ. තමන්ට පිහිට වුන සෑම වස්තුවකට කෙළෙහිගුණ දක්වන්න වැන්දා. ඒ අර්ථයන් ගත්තාම පූජනීයතාවයට ගරු කිරීම මනුෂ්‍යතාවයට උරුම දෙයක්. මව් පියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, පිදිය යුත්තන්ට පිදීම ආදියත් ඊට අයත් වෙනවා." මම දිගටම එසේ කියවෙන මතකය ඔය කියන තත්වය බෞද්ධ දර්ශනයට කොච්චර එකඟද යන්නයි. මට තියෙන ප්‍රශ්නය නැවත සමරේ විමසයි. "සමරේ මම හිතන විදියට නම් සැබෑ බෞද්ධ සිරිත් විරිත් කියන්නේ බෞද්ධ දර්ශනයේම කොටසක්. සරව කලගුණ සැලකීම ගැන බලමු. බුදුන් වහන-සේ බුදුවීමට සෙවන දුන් බෝධීන් වහන්සේට - සතියක් පුරා අනිමිස ලෝචන පූජාවෙන් උපහාරය කළ බව කියවෙනවා. එහෙම නම් පිදිය යුතු ඕනෑම දෙයකට පිදීමක් නරකකට වඩා යහපතක් නොවේද ?

ඔහු දිගු සුසුමක් සමඟ මද නිශ්ශබ්දතාවයකින් පසු, බෞද්ධ දර්ශනය කෙසේ වෙතත්, මිනිසාගේ පැවැත්මට නම් එවැනි සිරිත් වල වටිනාකමක් ඇති බවට එකඟතාවයකට පැමිණියේය. "අපි කාථා කළ මාතෘකාවට කියැවුනු අපූරු කවි පන්තියක් තිබෙනවා විමලරත්න කුමාරගම කිවියාගේ අයියනායක" වාර්තාවෙන් රාජිත පුතා මතක් කළේය. කවි පෙළ මාගේ මතකයට ආවේය. දිසාපති පදවිය ලබා වන්නියට ගිය කුමාරගම කිවියා එහි දුටු ආකර්ශනීය වූ දර්ශනය නම් වැව අසබඩ පිහිටි බෙනය සහිත මහ නුග රුකට අසරණ වූ ගැමියන් දුකට පිහිට ඉල්ලා කරන පිදිවිල්ලයි. කවියා තම නිර්මාණයනේ කෙරෙන ආගමනය නම් ඔවුන්ගේ නිර්ව්‍යාජ ප්‍රජාව බුද්ධිමතුන්ගේ ගර්භාවට ලක් නොකනර ලෙසටය. මන්ද ඔවුන් ඉන් ලබන තෘප්තිය වෙනත් කිසිම දෘෂ්ටියකට ලබා දිය නොහැකි හෙයිනි.

රසවත් සාකච්ඡා සමඟ සැදෑ සාදය මධ්‍යම රාත්‍රිය පසු කරමින් තිබුණි. "මට අද මෙතැනට එන්න ලැබීම ගැන කියාගන්න බැරි සතුටක් තියෙන්නේ. පුතාලා කාගේත් අදහස් හරි වටිනවා. මේවා කතා කරගෙන යන අතර මට අතීතය මතක් වුනා. අපි එක එක කාලවල ඇදහු සිතුවිලිවල වැරදි තැන් මට දැන් මේ වයසේදී දැනෙනවා. ඔහු අවේගශීලි පාපොච්චාරණයකට පිවිසියේ අප කිසිවකු නොසිතූ අකාරය.

"මා අතින් වූ අතපසුවීමක් මට වයසට යත්ම නිමා කළ නොහැකි පසු තැවිල්ලකට මා පත්කරන බව දැනෙනවා. මම අපේ පවුලේ තුන්වැනියා වැඩිමල් අක්කලා දෙන්නා ළඟට මගෙන් පසු මල්ලීලා දෙන්නෙක් ඉපදුනත්, ඒ දෙන්නම හදිසියේ අපහැර ගියාන් පසු මාව පුවලේ එකම පිරිමියා නිසා කාගේත් රැක වරණයට හේතු වුනා. අවුරුදු 18 තරම් වයසේ දී මට ද තදබල අසනීප තාවයක් මතුවීම ද ඊට හේතු වුනා. ප්‍රතිකර්මවලට වඩා මගේ ජීවිතය බේරුනේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට කළ පූජාව සමඟ වූ බාරය නිසා බව අම්මාගේ තදබල විශ්වාසය වුනා. මේ ඇදහිල්ල මම පිළිගන්නේම නැහැ. මාත් සමඟ ගොස් බාරය ඔප්පු කිරීමට අම්මාට පුදුම ආශාවක් තිබුනේ. ඔහුගේ දෙනෙතින් කඩා හැලෙන කඳුළු අප සෑම අවේදනය කිරීමට සමත් විය.

"ඔය අතර මට විශ්ව විද්‍යාලේ යන්න අවස්ථාවක් ලැබීම නිසා අම්මාගේ අවශ්‍යතාව ඉටු කිරීම තවත් මඟ හැරි ගියා. අම්මා කෙටිකාලයක් තුළ හදිසි පිළිකා රෝගයක් වැළදී මිය යාම මට අදටත් පිළිතුරක් සොයගත නොහැකි සිද්ධියක් බවට පත්වෙලා." සුසුමන් සමඟ සංවේදිශීලි වූ ඔහුගේ මතකයෙන් කියවුනේ මව මෙලොව අතහැර යාමට ආසන්න හේතුව ඇය තමා වෙනුවෙන් වූ බාරය ඔප්පු කරගැනීමට නොහැකි වූ මානසික අසහහනය නිසා බව තමාට දැනෙන බවය. ඔහුගේ සංවේග ප්‍රකාශය නිමවූයේ තමා ආත්මවාදය පිලිනොගන්නා වුත් ඊළඟ භවයේදී තම මව් කුස ඉපදී මේ ණය ගෙවීමට අවස්ථාවක් උදාවේවා යන ප්‍රාර්ථනයෙනි. අප හැම කෙනෙකුටම ජීවිතයේ වැරදුන තැන් ඇති බව අමතක නොකරන ලෙස ඔහු ඉල්ලීමක් කළේ අපට සිතන්නට ගැඹුරක් ඉතිරි කරමිනි. කාගේත් වන්දනාවන් සමඟ ඔහු අප නිවසින් සමුගන්නේ කාටත් ආශිර්වාද කරමිනි. ඔහුගේ සමුගැනීම අපට සංවේගයක් ඇති කළේ එවන් ගැඹුරු චින්තනයකින් යුත් සංවේදී වැඩිහිටි සිරිත ඇසුරු කිරීම මෙවැනි රටක දී දුර්ලභ අවස්ථාවක් වන හෙයිනි.